සැ. යු. - 2009.03.13 දින පළ වූ අංක 1,593 දරන ගැසට් පත්‍රයේ III හා IV (අ) කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,594 - 2009 මාර්තු මස 20 වැනි සිකුරාදා - 2009.03.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 354 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 354 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 357 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 මාර්තු මස 27 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2009 මාර්තු මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහාධිකරණය - කොළඹ

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලැබූ ද්‍රව්‍ය හා හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ මහාධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2009.04.11 වැනි දින පෙ.ව. 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින පෙ.ව. 10.00 ට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුයි.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂාකර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතුය. චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පත ද ඉදිරිපත් කළ යුතුය.

දීපාලි විජේසුන්දර,
මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
කොළඹ.

2009 මාර්තු මස 02 වැනි දින,
කොළඹ මහාධිකරණයේදී ය.

### වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව

| අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | බී.1694/07 | 1. දම්රෝ වර්ගයට අයත් (තෙසා) සෝපා සෙට් (කෑලි 03) | 01 |
| | | 2. කෝපි මේස | 01 |
| 02. | බී.1695/07 | 1. එල්. ජී. වර්ගයේ ඩී. වී. ඩී. යන්ත්‍ර | 01 |
| | | එල්. ජී. වර්ගයේ ස්පීකර් මෙහෙයුම් යන්ත්‍ර | 01 |
| | | එල්. ජී. වර්ගයට අයත් ස්පීකර් 05, ස්පීකර් රඳවන | 04 |
| | | (නිවාස රූපවාහිනි කට්ටලයක්) | |
| 03. | බී. 1701/07 | සීරියල් අංක 1006020 දරන (සෝනි) වර්ගයට අයත් අඟල් 29 රූපවාහිනි යන්ත්‍ර | 01 |
| | | ක්‍රවුන් වර්ගයට අයත් ටී. වී. ස්ටෑන්ඩ් (කැබිනට්) | 01 |
| 04. | එච්. සී. 14/99 | 1. කැරියර් රෝලරය | 01 |
| 05. | අංක නැත | 1. අබලන් කැරකෙන පුටු | 01 |
| 06. | අංක නැත | 1. යතුරු පැදි අමතර කොටස් අඩංගු උරයක් | 01 |
| 07. | අංක නැත | 1. අබලන් සිටුවන විදුලි පංකා | 01 |
| 08. | අංක නැත | 1. අබලන් යකඩ පුටුවක් | 01 |
| 09. | අංක නැත | 1. අබලන් බයිසිකල් ලගේජ් | 01 |
| 10. | අංක නැත | 1. අබලන් ලී ඇඳන් කිහිපයකට අයත් කොටස් | |
| 11. | අංක නැත | 1. වාහන අමතර කොටස් කිහිපයක් | |
| 12. | අංක නැත | 1. අබලන් ස්පීකර් | 01 |
| 13. | අංක නැත | 1. යකඩ බට | 02 |
| 14. | අංක නැත | 1. සවලක් | 01 |
| 15. | අංක නැත | 1. බයිසිකල් බෝල අඩංගු කුඩා උරයක් | |
| 16. | අංක නැත | 1. අලවංගුවක් | 01 |
| 17. | අංක නැත | 1. වාහන අමතර කොටස් (දැති රෝද තොගයක්) | |

03-400

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## දැන්වීමයි

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව කරන දැන්වීම

සැම්සන් රුහුණ ඉංජිනියර්ස් (පුද්ගලික) සමාගම - පී. වී. 67091

ඉහත සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව 2009 පෙබරවාරි මස 20 වැනි දින සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කල අතර එහි ලියාපදිංචි කාර්යාලය අංක 110, කුමාරන් රත්නම් පාර, කොළඹ 02 ස්ථානයේ පිහිටා ඇත.

සී ද ඒ. ජයසිංහ,
සමාගම් ලේකම්,
සැම්සන් රුහුණ ඉංජිනියර්ස් (පුද්ගලික) සමාගම.

03-452

## දැන්වීමයි

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සමාගමේ පෙර නම : එල්ඕඑල්සී මයික්‍රෝ ෆිනෑන්ස් කම්පැණි ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීබී 3535
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධන පුර මාවත, රාජගිරිය
සමාගමේ දැනට
භාවිතා කරන නම : එල්ඕඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්

සී. එස්. එමානුවෙල්,
සමාගම් ලේකම්.

2008 ජූලි මස 3 වැනි දින.

03-519

## මහජන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සී/ස ලංකා ඔරික්ස් ෆැක්ටර්ස් PB 146 LOFAC සමාගම සී/ස. ලංකා ඔරික්ස් ලීසිං PLC PQ 70 (LOLC) සමාගමේ පූර්ණ අයිතිය ඇති උප සමාගමකි. මෙම සමාගම්හි අධ්‍යක්ෂ මණ්ඩලයන් විසින් 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 242 වැනි වගන්තිය අනුව ඉහත සඳහන් සමාගම් දෙක ඒකාබද්ධ කිරීමට තීරණය කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම යටතේ LOFAC සමාගමේ සියලු කොටස් අහෝසි වන අතර LOLC සමාගම වෙනුවෙන් කිසිදු ගෙවීමක් හෝ වෙනත් ආකාරයක සලකා බැලීමක් සිදු කරනු නොලැබේ. සී/ස LOLC සමාගම LOFAC සියලු කොටස් පවරා ගැනීමෙන් සී/ස LOFAC සමාගමේ සියලු වත්කම් හා බැරකම් ද පවරා ගනු ලැබේ.

LOLC සමාගමේ වර්තමාන අධ්‍යක්ෂක මණ්ඩලය LOLC සහ LOFAC ඒකාබද්ධ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ක්‍රිෂාන්ති එමානුවෙල් මිය,
සමාගම් ලේකම්.

03-518

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : වෙන්චුරා - එක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2009 ජනවාරි මස 21 වැනි දින
සමාගමේ අංකය : පී. වී. 66825
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 280, හිල් වීදිය, නැදිමාල, දෙහිවල.

කෝපරේට් ප්‍රොෆෙෂනල් සර්විසස් (පුද්ගලික) සමාගම.

අංක 37/1, කාසල් වීදිය, කොළඹ 08,
දුරකථන අංකය: 4866840

03-439

---

## සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 07 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනය

සමාගමේ නම : හෙරිටේජ් චේන් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 67013
ලියාපදිංචි ලිපිනය : 125/28, ඉල්ලගහවත්ත, තලාහේන, මාලබේ
ලියාපදිංචි දිනය : 2009 පෙබරවාරි 11

ලේකම්.

03-416

## 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9(1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : රණවීර එන්ටර්ප්‍රයිසස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී/වී. 67132
සංස්ථාපනය කල දිනය : 2009.02.25
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : මේන් ස්ට්‍රීට්, කන්තලේ

සමාගමේ ලේකම්,
ජේ ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම.

අංක 96 - 2/7, කන්සිස්ටරි බිල්ඩිම, මල්වත්ත පාර, කොළඹ 11
දු.ක. 011-4614887/011-4737315

03-373

---

## 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9(1) ට අනුව සමාගම් ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : ක්ලීන් ග්‍රීන් කන්ස්ට්‍රක්ෂන් (පෞද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී/වී. 67092
සංස්ථාපනය කළ දිනය : 2009.02.19
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 164/4 හි, ලෝවර් පාර, ඔර්ක්ස් හිල්. ත්‍රිකුණාමලය

සමාගමේ ලේකම්.

03-374

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : A and A Janitorial (Pvt) Ltd
සමාගමේ අංකය : PV 67170
සංස්ථාගත කළ දිනය : .2009.03.02
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 184E, 17 වැනි පටුමග, ඉසුරු පුර, මාලබේ.

2009 පෙබරවාරි මස 03 වැනි දින.

03-401

## 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9(1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : එම් අයි එම් ටෙලිකොම් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී/වී. 66877
සංස්ථාපනය කළ දිනය : 2009.01.26
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : දාරුස්සලම් මොස්ක් පාර, ඩිවිෂන් 03, පුල්මුඩෙයි.

සමාගමේ ලේකම්,
ජේ ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම.

අංක 96 2/7, කන්සිස්ටරි බිල්ඩිම, මල්වත්ත පාර, කොළඹ 11
දු.ක. 011-4614887/011-4737315

03-372

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

හෝමාගම, මාගම්මන දියගම පාරේ අංක 154/1 හි පදිංචිව සිට දැනට කොළඹ 15 ශාන්ත ජේම්ස් වීදියේ අංක 115/5 දරන ස්ථානයේ පදිංචිව සිටින වඩුසිංහ ආරච්චිගේ අනුජා නිල්මිණී පෙරේරා වන මා විසින් 1998 පෙබරවාරි මස 16 වැනි දින ලංකාවේදී අත්සන් තබන ලද ශ්‍රී ලංකා රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දින පොත් අංක 13-12 ලියාපදිංචිව ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍ර අංක 51, 32 දරන ඇටෝර්නි බල කරය මගින් මා වෙනුවෙන් කටයුතු කිරීමට හෝමාගම, මාගම්මන දියගම පාරේ අංක 154/1 හි පදිංචි වෙඩික්කාර ආරච්චිගේ මානෙල් සිල්වා යන අය වෙත ප්‍රදානය කර තිබූ ඇටෝර්නි බලය මෙමගින් අවලංගු කරන ලද බවත් එය මෙවක් පටන් කිසියම් හෝ බලපැවැත්මක් නොවන බවද එය මෙවක් පටන් කිසියම් හෝ බලපැවැත්මක් නොවන බවද ඒ හා සම්බන්ධව කිසිම වගකීමක් මෙවක් පටන් මා විසින් නොදරන බව ද මෙමගින් සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවට දැනුම් දී සිටිමි.

වඩුසිංහ ආරච්චිගේ අනුජා නිල්මිණී පෙරේරා.

වර්ෂ 2009 ක් වූ පෙබරවාරි මස 28,

03-406

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත කාණ්ඩ අංක 9 ප්‍රකාරව ටැජිල් ඩිවලොප්මන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2009 පෙබරවාරි මස 12 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ටැජිල් ඩිවලොප්මන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 67025
ලියාපදිංචි ලිපිනය : ලක්ෂ්මි එස්ටේට්, නෙහින්න, දොඩංගොඩ, කළුතර දකුණ

සමාගම් අධ්‍යක්ෂක.

03-529

---

## ඊ - ටෙල් කෝපරේෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

පී. වී. 67179

ඉහත සඳහන් සමාගම 2009 මාර්තු මස 02 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 06, ආර්. ඒ ද මෙල් මාවත, කොළඹ 04 ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බී. ඩී. ඕ. බිස්කොන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2009 මාර්තු මස 03 වැනි දින,
අංක 65/2,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

03-528

---

## කළම්බු කන්සීප් (ප්‍රයිවට්) ලිමිටඩ්

පී. වී 67180

ඉහත සඳහන් සමාගම 2009 මාර්තු මස 02 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 51, 1 ඒ, පස් වන පටුමග, කොළඹ 03 ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බී. ඩී. ඕ. බිස්කොන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2009 මාර්තු මස 03 වැනි දින,
අංක 65/2,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

03-527

---

## දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනත

ආර්. එම්. ආර්. පෙතියාගොඩ ඇන්ඩ් කොම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් පී. වී. 66836

ඉහත සඳහන් සමාගම 2009 ජනවාරි මස විසි එක් වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 182/ඒ, ඩී. එස්. සේනානායක විදිය, නුවර ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බිස්නස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රියල් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2009 පෙබරවාරි මස 26 වැනි දින,
අංක 65/2,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

03-526

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගොඩකවෙල, රංවල පදිංචි අතාවුද මුදියන්සේලාගේ එඩ්මන්ඩ් අතාවුද බණ්ඩා බෝපෙගෙදර වන මා විසින් 1998 අගෝස්තු මස 01 වැනි දින පැල්මඩුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් ශ්‍රියාණි විජයගුණවර්ධන මහත්මිය විසින් ලියා සහතික කළ අංක 15034 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් ගොඩකවෙල, උඩරංවල ශ්‍රී විජයානන්දාරාමාධිපති ශාස්ත්‍රවේදී පූජ්‍ය රංවල පඤ්ඤානන්ද ස්ථවිරයන් වහන්සේ වෙත පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කළ බැව් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

03-411

### සීමාසහිත සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත සීඑල්සී ඇසට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම

අධිකරණ අමාත්‍යාංශයේ හිටපු ලේකම් සහ හිටපු මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා ද වන නීතිඥ, වෝල්ටර් ලද්දුවහෙට්ටි වන මම, ඉහත නම් සඳහන් සමාගම්වල අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් පත්කිරීම සඳහා වූ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අභියෝජනාවකට අනුශාංගික වශයෙන් 2009 මාර්තු මස 05 වැනි දින එම තනතුරට පත්කර ඇති බව ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ. මෙම පත්කිරීමේ මූලික අරමුණ 2007 අංක 07 දරන සමාගම් පනතේ IX කොටස යටතේ ණයහිමියන් සමග සමථයක් සකස් කිරීම සහ අනුමත කර ගැනීමේ පහසුකම් සලසාලීම සඳහාය. මාගේ නිල ලිපිනය කොළඹ 5, වජිර පාරේ අංක 143 ඒ ය.

වොල්ටර් ලද්දුවහෙට්ටි,
අද්මිනිස්ත්‍රාසිකරු.

03-546

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

හාරිස්පත්තුව, මැදවල, ගල්පඩිගාව වත්තේ අංක 48 දරන ස්ථානයේ පදිංචි දෙනියේ ගෙදර අසේල නිශාන්ත මයා විසින් උකස් කරන ලද දේපළ.

ණය යොමුව : 270/2006

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.01.02 දිනැති අංක 1583 ගැසට් පත්‍රයේ හා 2008.12.26 දිනැති 'දිනමිණ', 'තිනකරන් ' හා 'ඩේලි නිවුස්' යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව මුල් මුදල් ශේෂය ද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය, ගාස්තු හා එකී ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය පිහිටි ස්ථානයේ දී 2009.06.09 වැනි දින පෙරවරු 11.30 ට මහනුවර ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව, මැදසියපත්තු, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා සීමාව තුළ, මොරගම්මන දැනට මැදවල හි (ඔප්පුව අනුව මොරගම්මන) පිහිටි, බලයලත් මිනින්දෝරු පී. පුංචිහේවා මයා විසින් සාදන ලද 2005 ජනවාරි මස 12 වැනි දිනැති අංක 2909 දරන පිඹුරේ කැබලි අංක 1 යනුවෙන් පෙන්නුම් කර ඇති 'ගල්පඩිගාව වත්ත' යයි හඳුන්වනු ලබන, ඉහත කී අංක 2909 දරන පිඹුර අනුව ඊසාන දෙසට : ඩන්කන් කුලතුංගට අයත් ඉඩම වෙන් කරන ජීව වැට ද, ගිනිකොණ දෙසට : බලයලත් මිනින්දෝරු පී. ස්පෙන්සර් මයා විසින් සාදන ලද 243 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි, එම ඉඩමේ ම ඉතිරි කොටස ද, නිරිත දෙසට : බොක්කාවල සිට පාසැලට යන පාර ද, වයඹ දෙසට : බොක්කාවල සිට කටුගස්තොට ට යන පාර ද, මායිම් වූ අක්කර දෙකයි රූඩ් එකක (අක්. 2 රූ. 1 පර්. 0) වපසරියෙන් යුත්, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල හා එහි තුළ ඇති සැම සියළු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච්. 753/46 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ඩී. තිලකරත්න මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
2 වැනි නගර ශාඛාව,
මහනුවර.

03-538

---

### මහජන බැංකුව - දික්වැල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2009.04.02 වැනි දින ප. ව. 12.30 ට මෙහි පහත විස්තර වන දේපල, දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

01. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ දික්වැල්ලේ පිහිටි කළුගෙවත්ත නැමැති ඉඩමේ දකුණු කොටසේ බටහිර 1/2 කොටස බෙදා වෙන් කළ අංක 02 දරන පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාල ඉඩම සියළු වැව්ලි හා ගොඩනැගිලි ද සමග වේ.

02. ඉහත කී දික්වැල්ලේ පිහිටි කළුගෙවත්ත ඉඩමේ දකුණු කොටසේ බටහිර 1/2 කොටස බෙදා වෙන් කළ අංක 03 දරන පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාල ඉඩම සහ එහි පිහිටි සියළු වැව්ලි හා ගොඩනැගිලි ද සමග වේ.

වැඩි විස්තර සඳහා 2008.09.05 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2008.10.22 දින දිනමිණ පුවත්පතේ ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - මාතර, බෙලිඅත්ත පාරේ, දික්වැල්ල වැලිහිටිය හන්දියෙන් කි. මී 1/4 ක් පමණ ගොස් දකුණට වැටී ඇති මාර්ගයේ ගියවිට පාරේ දකුණු පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැණුම් මිලෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් ගැණුම් මිළෙන් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මාතර, පිට්ටනිය පාරේ, අංක 38/1, ඒ දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශිය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 041- 2222792, 2222822 හා 2224773.
ෆැක්ස් අංකය - 041- 2222688.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුදුවත්ත,
වල්ගම, මාතර.

දුරකථන අංක : 041 - 2228731, 071-4438516.

03-492

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0100004915.
ණයකරුගේ සම්පූර්ණ නම: කපුතැන්නදිගේ අසුන්තා ප්‍රනාන්දු

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2002.12.20 වැනි දින අංක 1268 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.12.31 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 228 ඒ , වලව්වත්ත, කැස්බෑව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ විසින් 2009.04.29 වැනි දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හයසිය තිස්අටයි ශත හැටඅටක (රු. 200,638.68) මුදලක් වර්ෂ 2002.05.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක් ලක්ෂ පනස්හයදහස් හාරසිය දාහතයි ශත පනස්හයක (රු. 156,417.56) මුදල ද, 2002.05.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස් හතරදහස් දෙසිය විසිඑකයි ශත දොළහක (රු. 44,221.12) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හයසිය තිස්අටයි ශත හැටඅටක් (රු. 200,638.68) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ පනස්හයදහස් හාරසිය දාහතයි ශත පනස්හයක (රු. 156,417.56) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.87% බැගින් වන පොළියක් 2002.06.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ පානදුර තොටමුණේ වාද්දු වස්කඩු දෙබද්ද හි බටහිර මහවාද්දුව වරිපනම් අංක 68 වෙරළ පාරේ පිහිටි මුදිල්ලගහවත්ත හෙවත් මිදෙල්ලගහවත්ත හෙවත් කිරිපැල්ලගහවත්ත නැමැති ඉඩමට එල්. පී. ඩබ්. ප්‍රනාන්දු මානක විසින් 1992.09.20 දින මැන සාදන ලද අංක ක/1/92 පිඹුර ප්‍රකාර ලොට් 1 ට මායිම් උතුරට : ආර් කල්දේරා හා එම් පී. එම් කුරේ යන අයගේ උරුමක්කරුවන්ගේ ඉඩම (ලොට්4 ) ද, නැගෙනහිරට : රාසයියා හිමිකම් කියන ලොට් 3 ද, දකුණට: වෙරළ පාර හා ප්‍රතිමා ස්ථානය ද බස්නාහිරට : පිලොමිනා පීරිස් හා සුනිල් ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් හතරයි දශම හයක් (අක්. 0 රූ. 0 පර්. 34.6) වපසරියකින් යුක්ත ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග අයිතිය ද පානදුර ඉඩම් කාර්යාලයේ ජී 61/293 හි ලියාපදිංචි වී ඇත.

වර්ෂ 2009 ක් වූ මාර්තු මස 04 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

03-499

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0100002647.
ණයකරුගේ සම්පූර්ණ නම: කලවානේ විදානෙලාගේ නන්දසිරි.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2005.04.22 වැනි දින අංක 1390 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.09.29 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 228 ඒ , වලව්වත්ත, කැස්බෑව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ විසින් 2009.04.29 වැනි දින පෙ. ව. 10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ දාසයදහස් තුන්සිය අසූතුනයි ශත හතළිස් එකක (රු. 116,383.41) මුදලක් වර්ෂ 2003.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැටතුන්දහස් තුන්සිය හැත්තෑහතයි ශත හැටක (රු. 63,377.60) මුදල ද, 2003.01.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් පනස්තුන්දහස් පහයි ශත අසූඑකක් (රු. 53,005.81) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ දාසයදහස් තුන්සිය අසූතුනයි ශත හතළිස් එකක් (රු. 116,383.41) ද,

(2) එකී රුපියල් හැට තුන්දහස් තුන්සිය හැත්තෑහතයි ශත හැටක (රු. 63,377.60) මුදල මත අයවිය යුතු වර්ෂයකට 20.50% බැගින් වන පොලියක් 2003.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ පානදුර තල්පිටිදෙබැද්ද කෝරළේ පානදුර ලියාපදිංචි කොට්ඨාසයේ පින්වත්ත ග්‍රාමයෙහි පිහිටි කෝස්ගහවත්ත ගොරකගහවත්ත, බුළුගහවත්ත හෙවත් දවටගහවත්ත නැමැති ඉඩමට 1985.02.11 දින එස්. වික්‍රමසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 1764 පිඹුර ප්‍රකාර ලොට් 11 ට මායිම්, උතුරට : ලොට් 12 හා 32 ද, නැගෙනහිරට : ලොට් 15 ද, දකුණට: ලොට් 10 ද, බටහිරට : ලොට් 07 හා එම්. රසල් තාබෲ හා අනෙක් අයට අයිති අඹගහවත්ත ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහසයයි දශම අටක් (අ. 0 රූ. 0 පර්. 16.8) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පාරවශතාවය ද සමග පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ්. 247/50 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ මාර්තු මස 04 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

03-500

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0100003553.
ණයකරුගේ සම්පූර්ණ නම: විදානගමගේ දොන් සුමිත්.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2005.09.30 වැනි දින අංක 1413 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.10.08 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. අයි. ගල්ලෑල්ල විසින් 2009.04.22 වැනි දින ප. ව. 2.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූහත්දහස් අටසිය අනූතුනයි ශත අසූදෙකක (රු. 97,893.82) මුදලක් වර්ෂ 2002.11.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැටහයදහස් අටසිය විසිහතරයි ශත හැත්තෑදෙකක ( රු. 66,824.72) මුදල ද, 2002.11.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස්එක්දහස් හැටනමයයි ශත දහයක් (රු. 31, 069.10) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූහත්දහස් අටසිය අනූතුනයි ශත අසූදෙකක් (රු. 97,893.82) ද

(2) එකී රුපියල් හැටහයදහස් අටසිය විසිහතරයි ශත හැත්තෑදෙකක (රු. 66,824.72) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.50% බැගින් වන පොලියක් 2002.12.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභාවේ, හේන්පිට ග්‍රාමයෙහි පිහිටි මැද්දේ පඳුර ඕවිට නැමැති ඉඩමට 1996.11.28 වැනි දින ජේ. පී. අයි. අබේකෝන් මානක තැන විසින් මැන සම්පාදිත අංක 4730 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම්, උතුරට : අඩි පාරද, නැගෙනහිරට : ඒ. ඩී. දැනියල් පෙරේරාගේ උරුමකරුවන්ට අයිති ඉඩම ද, දකුණට ජී. සෝමවතීට අයිති ඉඩම ද, බටහිරට : පාරද යන මායිම් තුළ පිහිටි පර්චස් දහහතරයි දශම දෙකයි තුනක් (අ. 0 රූ. 0 පර්. 14.23) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද සමග අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන්. 119/85 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ මාර්තු මස 04 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

03-501

---

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2500001577.
ණයකරුගේ සම්පූර්ණ නම: රත්නප්පු හේවගේ විජේපාල

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2007.06.29 වැනි දින අංක 1500 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2007.08.29 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න විසින් 2009.04.29 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැත්තෑහතරදහස් නමසිය පනස් එකයි ශත විසිඑකක (රු. 174,951.21) මුදලක් වර්ෂ 2006.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ පනස්හත්දහස් තුන්සිය අනූහතරයි ශත අටක (රු. 1,57,394.08) මුදල ද, 2006.04.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් දාහත්දහස් පන්සිය පනස් හතයි ශත දහතුනක් (රු. 17,557.13) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැත්තෑහතරදහස් නමසිය පනස් එකයි ශත විසිඑකක් (රු. 1,74,951.21) ද,

(2) එකී රුපියල් එක් ලක්ෂ පනස්හත්දහස් තුන්සිය අනූහතරයි ශත අටක (රු. 1,57,394.08) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.50% බැගින් වන පොළියක් 2006.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිනිගොඩ කෝරළේ, දෙයාලදහමුන පත්තුවේ 'රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාවේ' වරාගොඩ ග්‍රාමයෙහි පිහිටි හිටිනාවත්ත, පළුවත්ත, බොරුල්ලෙහේන හෙවත් බෝගහමුලහේන නැමැති ඉඩමට 2001.10.10 දින ටී. එන්. කාදර් මානක තැන විසින් මැන සම්පාදිත අංක 4310 පිඹුර ප්‍රකාර ලොට් 1 ට මායිම්, උතුරට: පාර ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට: දොඩන්ගහමඩිත්ත ද බටහිරට හිටිනා වත්ත, පළුවත්ත, බොරුල්ල හේන හෙවත් බෝගහමුල හේන හි ලොට් 1 බී ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකක (අක්. 0 රූ. 2 පර්. 0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 333/232 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ මාර්තු මස 04 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

03-502

---

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0503300205.
ණයකරුගේ සම්පූර්ණ නම: විජේරත්න මුදියන්සේලාගේ
පොඩිමැණිකේ විජේරත්න

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2003.03.14 වැනි දින අංක 1280 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.03.21 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ

අංක 85, බෝමළුව පාර, වටපුළුව, මහනුවර යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2009.04.24 වැනි දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැටඅටදහස් හාරසිය අසූදෙකයි ශත හැත්තෑවක (රු. 1,68,482.70) මුදලක් වර්ෂ 2002.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් ලක්ෂයක (රු. 1,00,000.00) මුදල ද, 2002.03.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් හැටඅටදහස් හාරසිය අසූදෙකයි ශත හැත්තෑවක් (රු. 68,482.70) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැටඅටදහස් හාරසිය අසූදෙකයි ශත හැත්තෑවක් (රු. 1,68,482.70) ද,

(2) එකී රුපියල් ලක්ෂයක (රු. 1,00,000.00) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.00% බැගින් වන පොළියක් 2002.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ අඩසිය පත්තුවේ බණ්ඩාරපොල ග්‍රාමයේ පිහිටි බණ්ඩාරපොල ගෘප් හි කොටස යන ඉඩම බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් මැන සැකසූ අංක 3412 සහ 1995.08.01 දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 01 ට මායිම්, උතුරට : ලොට් 02 ද, නැගෙනහිරට: අංක 647 පිඹුර ප්‍රකාර ලොට් 12 සහ රත්නායකට අයත් ඉඩම ද, දකුණට : පාර ද, බටහිරට : අංක 647 පිඹුරේ ප්‍රකාර ලොට් 14 සහ විජේසේකරට අයත් ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසිනවයක (අක්. 0 රූ. 0 පර්. 29) විශාල ඉඩම හා ඊට අයත් සියලු දේ ද, මාර්ග අයිතිය ද සමග වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 466/94 හි ලියාපදිංචි කරන ලදී.

වර්ෂ 2009 ක් වූ මාර්තු මස 04 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

03-503

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : 2300000160.

ණයකරුගේ සම්පූර්ණ නම: තෙන්නකෝන් මුදියන්සේලාගේ තිස්ස නිලන්ත තෙන්නකෝන් සහ නවරත්න මුදියන්සේලාගේ පද්මලතා සන්ධ්‍යා කුමාරි

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2009.01.23 වැනි දින අංක 1584 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2009.01.23 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 48/1, කළුගල්පිටිය, බදුල්ල, යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. ජයතිලක විසින් 2009.04.24 වැනි දින ප. ව. 2.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ අනූදෙදහස් පන්සිය පනස්තුනයි ශත හතක (රු. 1,92,553.07) මුදලක් වර්ෂ 2008.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හැටහතරදහස් හාරසිය විසිනමයයි ශත හතළිස්පහක (රු. 1,64,429.45) මුදල ද, 2008.06.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිඅටදහස් එකසිය විසිතුනයි ශත හැටදෙකක් (රු. 28,123.62) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ අනූදෙදහස් පන්සිය පනස්තුනයි ශත හතක් (1,92,553.07) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හැටහතරදහස් හාරසිය විසිනමයයි ශත හතළිස්පහක (රු. 1,64,429.45) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.90% බැගින් වන පොළියක් 2008.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදකිදමහපත්ත කෝරළේ, බණ්ඩාරවෙල කොටසේ කැබිල්ලවෙල ගෙඩියාරොද ග්‍රාමයෙහි පිහිටි ගෙඩිවැල්රොද නැමැති ඉඩමට 2000.03.25 දින විජිත සෙල්ලහේවා මානක තැන විසින් මැන සම්පාදිත අංක 220 පිඹුර ප්‍රකාර ලොට් 04 ට මායිම්, උතුරට : කැබලි අංක 3 ද, නැගෙනහිරට : ඇළ සහ අඩිපාර ද, දකුණට : අඩිපාර ද, බටහිරට : ජේ. එම්. සරත් කුමාරට අයිති ඉඩම සහ කැබලි අංක 3 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසිඑකක් (අක්. 0 රූඩ්. 0 පර්. 21) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග

පරවශතාවය ද සමග බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 135/248 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ මාර්තු මස 04 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

03-504

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0303300321.
ණයකරුගේ සම්පූර්ණ නම: ජයකොඩි ආරච්චිලාගේ ජයසේන සහ පින්නගොඩ විදානලගේ කරුණාවතී

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2003.12.19 වැනි දින අංක 1320 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.06.19 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 228 ඒ, වලව්වත්ත, කැස්බෑව, යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ විසින් 2009.04.28 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතළිස්හත්දහස් හයසිය හතළිස්හතයි ශත විසිපහක (රු. 1,47,647.25) මුදලක් වර්ෂ 2002.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූඑක්දහස් තුන්සිය පනස්තුනයි ශත හතළිස්හයක (රු. 91,353.46) මුදල ද, 2002.09.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් පනස්හයදහස් දෙසිය අනූතුනයි ශත හැත්තෑනමයක් (රු. 56,293.79) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක් ලක්ෂ හතළිස් හත්දහස් හයසිය හතළිස් හතයි ශත විසිපහක් (රු. 1,47,647.25) ද,

(2) එකී රුපියල් අනූඑක්දහස් තුන්සිය පනස්තුනයි ශත හතළිස්හයක (රු. 91,353.46) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.00% බැගින් වන පොළියක් 2002.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණේ උතුරේ කළුතර බැද්දේ නාගොඩ කපුදූවවත්ත ග්‍රාමයේ හි පිහිටි කපුගහවත්ත කැබැලි 63 නැමැති ඉඩමට 1995.01.17 දින එන්. ද එස්. වීරක්කොඩි මානක තැන විසින් මැන සම්පාදිත අංක 3491 පිඹුර ප්‍රකාර ඉඩමට මායිම්, උතුරට : ලොට් 62 ද, නැගෙනහිරට : ලොට් 62 සහ 9 (අඩි 8 පළල පාරකට වෙන් කළ බිම ද), දකුණට : ලොට් 9 (පාරකට වෙන් කළ බිම) ලොට් 64 සහ පී. පී. ඒ. 3407/1 සහ බටහිරට : ලොට් 64 සහ පී. පී. ඒ 3407/1 යන මායිම් තුළ පිහිටි පර්චස් අටයි දශම පහක් (අක්. 0, රූ. 0 පර්. 8.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද, සමග කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 17/73 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ මාර්තු මස 04 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

03-505

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0500000309.
ණයකරුගේ සම්පූර්ණ නම: බස්නායක මුදියන්සේලාගේ සිසිර බස්නායක

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2003.11.14 වැනි දින අංක 1315 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.11.18 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. අයි. ගල්ලෑල්ල විසින් 2009.04.21 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැටදහස් දෙසිය හැටහතරයි ශත අටක (රු. 1,60,264.08) මුදලක් වර්ෂ 2002.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ දෙදහස්

හාරසියයි ශත අනූඅටක (රු. 1,02,400.98) මුදල ද, 2002.09.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් පනස්හත්දහස් අටසිය හැටතුනයි ශත දහයක් (රු. 57,863.10) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක් ලක්ෂ හැටදහස් දෙසිය හැටහතරයි ශත අටක් (රු. 1,60,264.08) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ දෙදහස් හාරසියයයි ශත අනූඅටක (රු. 1,02,400.98) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.00% බැගින් වන පොළියක් 2002.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහගල්බොඩ මීගොඩ කෝරළේ, වැඋඩුවිල්ලි හත්පත්තුවේ රංගම වැල්ලව පිහිටි බෙරිකොච් වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ස්ටැන්ලි ගුණසේකර විසින් මැන සාදන ලද අංක 5821 ඒ සහ වර්ෂ 1996.07.10 දින දරන පිඹුර ප්‍රකාර කැබැලි අංක 01 ට මායිම් උතුරට : ලොට් 5 ද, නැගෙනහිරට: ලොට් 13 ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරට : අංක 77 දරන පිඹුර ප්‍රකාර ලොට් ජේ ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහහතරක (අක්. 0, රූ. 0, පර්. 14) විශාල ඉඩම සමග මාර්ග අයිතිය ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1336/266 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ මාර්තු මස 04 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

03-506

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2300000259.
ණයකරුගේ සම්පූර්ණ නම: අනෝජා ප්‍රියන්ති පුංචිහේවා

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2008.11.21 වැනි දින අංක 1575 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2008.12.15 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 48/1, කළුගල්පිටිය, බදුල්ල, යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. ජයතිලක විසින් 2009.04.24 වැනි දින පෙ. ව. 10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ හැටතුන්දහස් නමසිය දහඅටයි ශත හැත්තෑපහක (රු. 8,63, 918.75) මුදලක් වර්ෂ 2008.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හත්ලක්ෂ හතළිස් අටදහස් නමසිය හැත්තෑහතරයි ශත හතළිස්නමයක (රු. 7,48,974.49) මුදල ද, 2008.06.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක්ලක්ෂ දහහතරදහස් නමසිය හතළිස්හතරයි ශත විසිහයක් (රු. 114,944.26) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අටලක්ෂ හැටතුන්දහස් නමසිය දහඅටයි ශත හැත්තෑපහක් (රු. 8,63.918.75) ද,

(2) එකී රුපියල් හත්ලක්ෂ හතළිස් අටදහස් නමසිය හැත්තෑහතරයි ශත හතළිස්නමයක (රු. 7,48,974.49) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.90% බැගින් වන පොළියක් 2008.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළේ, මුප්පනේ ග්‍රාමයේ පිහිටි වරිපනම් අංක 232 දරන එෆ්වීපී 172 හි ලොට් 55 T හි කොටසක් වන කෝවිල්ගොඩහේන නමැති ඉඩමට 2006.04.09 දින බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් සකසන ලද අංක 2758 පිඹුර ප්‍රකාර ලොට් 1 දරන ඉඩමට මායිම් උතුරට : ප්‍රධාන පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද, 2006.03.06 දින බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් සකසන ලද අංක 2742 පිඹුරෙහි වූ ලොට් 1න් ද, එස්. වීරසිංහගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : එස්. වීරසිංහගේ ඉඩමෙන් ද, එෆ්වීපී 172 හි ලොට් 55 සී එන් ද, දකුණට: එෆ්වීපී 172 හි ලොට් 55සි එන් ද, දැන් කේ. එස්. ද සිල්වාට අයිති. පී. ඒ. ප්‍රනාන්දුගේ ඉඩමෙන් ද, සහ බටහිරට : දැන් කේ. එස් ද සිල්වාට අයිති පී. ඒ. ප්‍රනාන්දුගේ ඉඩමෙන් ද ප්‍රධාන පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද, යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් හතක (අක්. 0 රූඩ් 0 පර්. 37) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද, මාර්ග පරවශතාවය ද සමග මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 54/208 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ මාර්තු මස 04 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

03-507

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0500000361.
ණයකරුගේ සම්පූර්ණ නම: සේදිල්ලගේ දොන් පාලිතරත්න

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2008.11.21 වැනි දින අංක 1575 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2008.11.21 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 85, බෝමළුව පාර, වටපුළුව, මහනුවර යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2009.04.24 වැනි දින ප. ව. 2.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් පනස්දෙදහස් හාරසිය හතළිහයි ශත හැටක (රු. 52,440.60) මුදලක් වර්ෂ 2004.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හතළිස්දහස් හාරසිය අටයි ශත දහතුනක (රු. 40,408.13) මුදල ද, 2004.12.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් දොළොස්දහස් තිස්දෙකයි ශත හතළිස්හතක් (රු. 12,032.47) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පනස්දෙදහස් හාරසිය හතළිහයි ශත හැටක් (රු. 52,440.60) ද,

(2) එකී රුපියල් හතළිස්දහස් හාරසිය අටයි ශත දහතුනක (රු. 40,408.13) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.50% බැගින් වන පොලියක් 2005.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, වගපනහ පල්ලේසිය පත්තුවේ නායකුඹුර සහ වත්තෙගම්මැද්ද ග්‍රාමයන්හි පිහිටි කුළුපනාවත්ත නැමැති ඉඩමට 1997.02.27 දින ඩී වීරසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 3683 පිඹුර ප්‍රකාර ලොට් 40 ට මායිම් උතුරට : ලොට් 236 (පාර) ද, නැගෙනහිරට : ලොට් 39ද , දකුණට : ලොට් 59 ද, බටහිරට : ලොට් 41 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක (අක්. 0 රූඩ් 0 පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේ ද මාර්ග පරිවශතාවය ද සමග මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 415/266 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ මාර්තු මස 04 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

03-508

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මාළිගාවත්ත ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දා වූ ද, 2006.12.09 දින සහ අංක 2670 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, දොන් මැනුවල්ගේ දොන් ජයතිස්ස යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009 ක් වූ අප්‍රේල් මස 20 වැනි දින පෙ. ව. 10.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ මුල්ලේරියාවේ පිහිටි තලංගම පටුමගෙහි වරිපනම් අංක 50/1, 50/4, 50/5 හි කුඩළු ආගර කුඹුර නමැති ඉඩමට බලයලත් මානක ජී. එම්. කමල් පෙරේරා විසින් මැන සාදන ලද අංක 94/2006 සහ 2006.05.24 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 3, 4 සහ 6 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස් වේ.

*විශාලත්වය :* ලොට් අංක 3 හි පර්චස් 8යි.
ලොට් අංක 4 හි පර්චස් 8 යි.
ලොට් අංක 6 හි පර්චස් 10.20 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.07.04 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.07.22 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුවේ.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (01) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තුව රුපියල් පන්සියය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක්

ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

03-463/1

---

**සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - තිඹිරිගස්යාය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. පී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දා වු ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද 2003.07.03 දිනැති අංක 588 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කමල් නිල් සේනක සිදන්ත රත්වත්තේ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා ලත් බලය මත පහත සඳහන් දේපළ පිහිටි ස්ථානයේ දී 2009 අප්‍රේල් මස 04 වැනි දින පෙ. ව. 10.30ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝකන්දර පිහිටි 'වෙල්ලන්ගිරිය එස්ටේට්' නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද 1999.11.08 දිනැති අංක 1657 දරන පිඹුරෙන් බෙදාවෙන් කරන ලද ලොට් 32 දරන ඉඩම සහ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් ලියා සහතික කරන ලද 2003.07.03 වැනි දිනැති අංක 588 දරන බැදුම්කරයේ දෙවන උපලේඛනයේ විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

*විශාලත්වය :* පර්චස් 10.71

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.10.13 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2006.10.26 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුවේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (01) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500) ක් ද,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු සහ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ආපසු නොගෙවීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, තිඹිරිගස්යාය ශාඛාව (දුරකථන අංක 4519862/2582606) හෝ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්)

දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

03-463/2

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කොටහේන ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඔලුව විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දා වූ 2006.11.29 දින සහ අංක 1833 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ආනන්ද සෙනරත් අතපත්තු යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009 ක් වූ අප්‍රේල් මස 17 වැනි දින පෙ. ව. 11.00ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ, උඩුගම්පොල

උපකාර්යාලයට අයත් උඩුගම්පොල පිහිටි කිරිඳවිට පාරේ, වරිපනම් අංක 38/10 දරන මීගහවත්ත හෙවත් මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මානකතැන බී. යූ. එස්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 2003.07.28 දිනැති අංක 739 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කර ඇති ඉඩම් කොටස වේ. විශාලත්වය පර්චස් 23.40 කි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.05.23 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.05.27 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ :

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල සියයට දෙකයි දශම පහ (2.5%),
4. ලිපිකරු සහ සෝෂක ගාස්තුව රුපියල් පන්සියයක් (රු. 500) ද,
5. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661826/2661816 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

03-463/3

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - හෙට්ටිවීදිය ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දා වූ 2007.06.18 දින සහ අංක 2175 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඇන්තනී ජුලියන් පිච්චෙයි සහ වයලට් මරිසිලා ජුලියන් යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009 ක් වූ අප්‍රේල් මස 21 වැනි දින පෙ. ව. 11.00ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ සහ කොළඹ මහ නගර සභා සීමාව තුළ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ අංක 8 දරන වසමේ කොටහේන බටහිර, ජම්පටා වීදියේ, දැන් කේ. බී. ක්‍රිස්ටි පෙරේරා මාවත නමින් හඳුන්වනු ලබන වරිපනම් අංක 79/1-5/14 දරන පස්වන මහලේ පිහිටි බලයලත් මානක පී. පරරාසසේගරම් විසින් මැන සාදන ලද අංක 2025 සහ 2001.10.10 දින දරන සභාධිපත්‍ය පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද සභාධිපත්‍ය ඒකකයෙහි ඒකක අංක 13 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වේ. විශාලත්වය ව. මී. 50.168 (ව. අ. 540).

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.08.15 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.08.22 වැනි දින අයිලන්ඩ්, දිවයින පුවත්පත් සහ 2008.08.22 දින තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල සියයට දෙකයි දශම පහක් (2.5%),
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000) ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තුව රුපියල් පන්සියයක් (රු. 500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

03-463/4

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මාළිගාවත්ත ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දා වූ ද, පිළිවෙලින් 2004.12.13 සහ 2006.01.06 දිනැති සහ අංක 1147 සහ 1148 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ගයාන් මෝටර්ස් නාමය, විලාශය සහ අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන දොන් මැනුවල්ගේ දොන් ජයතිස්ස යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009.04.20 වැනි දින ප. ව. 2.30ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවට අයත් බත්තරමුල්ලෙහි උපකාර්යාලය සීමාව තුළ, උතුරු තලංගම ගමෙහි පිහිටි කඩුවෙල පාරේ, වරිපනම් අංක 526 ලෙස දැක්වෙන මිල්ලගහ වත්ත නමැති ඉඩමට බලයලත් මානක ජී. චන්ද්‍රසේන විසින් මැන සාදන ලද 2001.03.01 දිනැති අංක 2001/126 දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1ඒ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වේ.

විශාලත්වය ඃ පර්චස් 6.01 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.07.04 වැනි දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2008.07.22 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුවේ ඃ

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (01)ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000) ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තුව රුපියල් පන්සියයක් (රු. 500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු, (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස් තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය ඃ 2863121

03-463/5

---

**පැන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පැන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී. එල්. සී. බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 අප්‍රේල් මස 06 වැනි දින ප. ව. 3.00ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ පල්ලේ පත්තුවේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුල දෙහිවල පිහිටි වැන්ඩවර්ට් පෙදෙසේ වරිපනම් අංක 31 දරන ඇපෝතිකරිවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් මැන සාදන ලද අංක 374 සහ 1998.09.29 දින දරන සැලැස්මේ ලොට් 3800 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නීර්ණය කර ඇති ඉඩම ප්‍රමාණය අ. 0 රූ. 0 පර්. 20.17 බිම් කැබැල්ල සහ එහි තුල පිහිටි සියලු දේ සමග.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1947 සහ 2006.02.01 දින දරන උකස්කරය මත උකස් කරන ලද දේපළ මත ලැබිය යුතු මුදල් ගෙවීම හෙසනයිට් ප්‍රොපටි ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් උකස්කරු වශයෙන් පැහැර ඇති හෙයින්,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009 මාර්තු මස 11 වැනි දින ඩේලිනිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ 2009.03.13 වැනි දින ගැසට් පත්‍ර බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය*.- දෙහිවල මංසන්ධියේ සිට ගාලු පාරේ කොළඹ දෙසට මීටර් 400ක් පමණ ගමන්කර වම්පසට හැරී වැන්ඩවර්ට් පෙදෙසෙහි මීටර් 175ක් පමණ ගමන් කළ විට ඔබගේ වම්පසට වන්නට මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.-වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවෙලේ ම පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුවේ.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ද,
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුලත ගැනුම් මිලේ පරිශේෂය වන 90%ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු ජොෂ්ඨ කළමණාකරු, නීති, පෑන් එෂියා බැන්කින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 2565573/2565565.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121

03-463/6

---

**ඩීඑෆ්සීසී බැංකුව (කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 14018 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, බලදොර කෝරළේ වෙල්පිටිය ගම්මානයේ පිහිටා ඇති බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සකසන ලද 2005 දෙසැම්බර් මස 31 වැනි දිනැති අංක 1882/2005 දරන පිඹුරු පතෙහි ලොට් අංක 01 ලෙස දක්වා ඇති ඇටදඹගහමුලවත්ත හෙවත් හැලඹගහමුලවත්ත ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම. ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ්. 1 පර්. 20.74 එහි පිහිටි ගස්වැල්, ගොඩනැගිලි, වගාවන් සහ සියල්ල සහිතව කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරගල විසින් ලියා සහතික කරන ලද, 2007 අප්‍රේල් මස 10 වැනි දින දාතමින් යුතු අංක 14018 දරන උකස්කරය ප්‍රකාර බොරළුවැව, ඒ එම් කේ රෙස්ටුරන්ට් නම් තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන බොරළුවැව පදිංචි ආරච්චිලාගේ මහින්ද කුමාරසිරි විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලදුව ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 අප්‍රේල් මස 07 වැනි අඟහරුවාදා දින ප. ව. 2.30ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 34,750 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක : 011-2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001:2000 සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය* :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

03-465

---

**ඩීඑෆ්සීසී බැංකුව (කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 14514 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩපොළ මැදලැස්ස කෝරළේ, පරබෑබිල ගම්මානයේ පිහිටා ඇති බලයලත්

මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සකසන ලද 1995 ජූලි මස 31 වැනි දිනැති අංක 130/95 දරන පිඹුරු පතෙහි ඒකාබද්ධ ලොට් අංක 09 සහ 14 දරන සහ ලොට් අංක 17 සහ 18 ලෙස සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද පරබැබිල එස්ටේට් ලෙස හැඳින්වෙන ඉඩම.

ඉඩමේ ප්‍රමාණයඃ **ලොට් අංක 09 සහ 14** : අක්. 0, රූඩ්. 0, පර්. 30 **ලොට් අංක 17** : අක්. 0, රූඩ්. 0, පර්. 15 **ලොට් අංක** 18 : අක්. 0, රූඩ් 0, පර්. 15 එහි පිහිටි ගස් වැල් ගොඩනැගිලි වගාවන් සහ සියල්ල සහිතව තවද, පිඹුරු පත් අංක 130/95, 130ඒ/95 සහ 130බී/95 හරහා ඇති මාර්ගය පොදුවේ භාවිතා කිරීමේ අයිතියද සමග,

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වදුරගල විසින් ලියා සහතික කරන ලද, 2007 දෙසැම්බර් මස 31 වැනි දින දාතමින් යුතු අංක 14514 දරන උකස්කරය ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ සහ එහි කාර්යාලය පොතුහැර පිහිටි සී/ස ෂාප් ඇපරල්ස් (පෞද්ගලික) සමාගම විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ඨ නොකරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 අප්‍රේල් මස 07 වැනි අඟහරුවාදා දින පෙ. ව. 10.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය .-* මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 34,750.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක : 011-2440366/77.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001:2000 සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

03-466

**සෙලාන් බැන්ක් පී. එල්. සී. - මහනුවර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු ඉතා වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යටිනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කිරිබත්කුඹුර ගමේ පිහිටි බෝන් බෲක් එස්ටේට් නමැති ඉඩමෙන් බෙදූ ලොට් 72 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියළු දේ.

ඉඩමේ ප්‍රමාණය පර්චස් 25 (ලොට් 73, 41, 1, 2, 4, 3 දරන ඉඩම් උඩින් හා දිගේ පොදු මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය ද සමඟ)

මෙම දේපල, මහනුවර පදිංචි සරත් බන්දුලසිරි ද මෙල් බන්ධනදායී වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම* :-මහනුවර කඩුගන්නාව මහා මාර්ගයේ කි. මී. 7.5ක් පමණ 108/2 බෝක්කුව දක්වා පැමිණ වමට හැරී විදුලිබල මණ්ඩල උප කාර්යාල පාරේ මීටර් 700 ක් ගමන්ගෙන දකුණට හැරෙන්න. මෙම පාරේ මීටර් 200 ක් පමණ ගිය විට වම් දෙසින් හමු වන අඩි 12 ක් පමණ පළල පාරේ කෙළවර දක්වා ගිය විට අදාළ දේපල පිහිටා තිබේ.

2009 ක් වූ අප්‍රේල් මස 07 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.12.29 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2006.12.08 වන දින ඩේලිමිරර්, ලංකාදීප සහ 2006.11.22 වන දින වීරකේසරී පුවත්පත බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.-විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සෙලාන් බැන්ක් පී. එල්. සී වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැන්ක් පී. එල්. සී., සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701284, 011-2456285, 011-2456291, 011-2456284

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව,
මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974 ෆැක්ස් : 081-2211025.

03-429

**මහජන බැංකුව - දික්වැල්ල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2009.04.02 දින පෙ. ව. 10.30 ට මෙහි පහත විස්තර වන දේපල, දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

01. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ දොඩම්පහළ පිහිටි පිස්සගෙවත්ත නමැති ඉඩමේ ලොට් අංක 'ඒ' කොටසින් බෙදා වෙන් කළ ලොට් අංක 01 දරන පර්චස් තිස්පහක් (අක්. 0, රූඩ් 0, පර්. 35) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේ ද වේ.

02. ඉහත කී දොඩම්පහල පිහිටි පිස්සගෙවත්ත නමැති ඉඩමේ ලොට් අංක 'ඒ' බෙදා වෙන්කළ ලොට් අංක 02 දරන පර්චස් පහක් (අක්. 0 රූඩ් 0 පර්. 5) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2008.10.31 දින *රජයේ ගැසට් පත්‍රයේ ද*, 2008.12.10 දින දිනමිණ පුවත්පතේ ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම*.- දික්වැල්ලේ සිට තංගල්ල පාරේ කි. මී. 1.5ක් පමණ ගියවිට හමුවන දොඩම්පහළ හන්දියේ (දික්වැල්ල - තංගල්ල පාරේ) පාරේ වම්පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*. - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැණුම් මිළෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිළෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් ගැණුම් මිළෙන් 2 1/2%ක්ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මාතර, පිට්ටනිය පාරේ, අංක 38/1, ඒ දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 041- 2222792, 2222822 හා 2224773
ෆැක්ස් අංකය - 041- 2222688

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිළෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.

දුරකථන අංක : 041 - 2228731, 071-4438516

03-495

---

**මහජන බැංකුව - උයන්වත්ත ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මෙහි පහත දැක්වෙන දේපල මා විසින් 2009.04.03 වැනි දින පෙ. ව. 10.30 ට දේපොල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දේපළ පිළිබඳ විස්තර**

01. මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ මාලිම්බඩ පිහිටි මැදවත්ත නමැති ඉඩමේ 'ඒ ' සහ 'බී' අක්ෂර දරන කැබලිවලින් බෙදා වෙන්කරන ලද පර්චස් තිස් දෙකක් (අක්. 0 රූඩ් 0 පර්. 32 ) විශාල අංක 3 දරන ඉඩම් කැබැල්ල සියළු වැවිලි හා ගොඩනැගිලි ද සමග වේ.

02. ඉහත කී මාලිම්බඩ පිහිටි මැදවත්ත නමැති ඉඩමේ 'ඒ' සහ 'බී' දරන කැබලිවලින් බෙදා වෙන්කරන ලද පර්චස් තුනයි දශම තුනයි අටක් (අ. 0 රූඩ් 0 පර්චස් 3.38) විශාල අංක 4 දරන ඉඩම් කැබැල්ල සහ එහි පිහිටි සියලු වැවිලි හා ගොඩනැගිලි ද වේ.

වැඩි විස්තර සඳහා 1999.09.10 දින *රජයේ ගැසට් පත්‍රයේ ද*, 1999.08.23 දින, දිනමිණ ඩේලිනිව්ස් හා තිනකරන් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම*. - මාතර අකුරැස්ස පාරේ සැතපුම් 4ක් පමණ ගිය විට මාලිම්බඩ මංසන්ධිය හමුවේ. එතැනින් දකුණට ඇති කද්දුව පාරේ යාර 75 පමණ ගොස් දකුණට වැටී ඇති වැල්ලතොට පාරේ සැ. 1/2ක් පමණ ගිය විට පාරේ දකුණු පස මෙම දේපොල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*. - වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල්, ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිළෙන් 10%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිළෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,

05. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මාතර මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 041- 2222792, 2222822 හා 2224773
ෆැක්ස් අංකය - 041- 2222688

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිළෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.

දුරකථන අංක : 041 - 2228731

03-494

---

## මහජන බැංකුව - මහරගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව ඇතුලත පොල්වත්ත ගමේ පිහිටියාවූද කැටකෑලගහවත්ත යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු සිරිල් වික්‍රමගේ විසින් සාදන ලද අංක 5602 හා 2002.11.20 දින දරන පිඹුරේ ලොට් අංක එක්ස් ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තාවූද පර්චස් දහනමයයි දශම අටක් (අක්. 0, රූඩ් 0, පර්. 19.8) විශාලවූද, ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2570/256 යටතේ ලියාපදිංචි කර ඇත්තාවූද බෙදා වෙන්කරන ලද මුළු ඉඩම් කොටස එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත්ය.

ප්‍රමාණයෙන් (අ. 0, රූඩ්. 0, පර්. 19.8) මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2009 අප්‍රේල් මස 06 වෙනි දින පෙ.ව. 10.30 ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට්පත්‍රයේ* 2009.01.23 වෙනි දිනද දිනමිණ, හා ඩේලිනිවුස් පුවත්පත්වල 2009.01.29 වෙනි දිනද පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමුකරන්න.

*දේපලට පිවිසීම.-* මහරගම හන්දියේ සිට පමුණුව පාරේ පොල්වත්ත හන්දිය දක්වා ගොස් එතනින් දකුණට ඇති කොට්ටාව බොරැල්ල පාර දෙසට ඇති පාරේ කි. මී. 1 ක් පමණ ගිය විට එතැනින් වමට ඇති ග්‍රාම සංවර්ධන පාරේ මීටර් 100 ක් පමණ ගිය විට පාරේ දකුණු පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන්වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10% ක් ,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක්වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත නුගේගොඩ, ස්ටැන්ලි තිලකරත්න මාවතේ අංක 102, මහජන බැංකුවේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුයි.

දුරකථන අංක 2854189, 2811007, 2825101 පැක්ස් අංක 2768018.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඒ. එස්. ලියනගේ, සා. වි.,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දිවුරුම්ලත් භාෂා පරිවර්තක.

අංක 228/ඒ,
වලව්වත්ත, කැස්බෑව,
දුරකථන අංක : 2703478, 0777-459823.

03-428

---

## හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - මාතලේ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

යටවත්ත ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මාතලේ දකුණ කවුඩුපැලැල්ල ගමේ පිහිටි අස්වැද්දුම මකුල්කොටුව නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් 1990.10.05 වන දින අංක 156/90 දරන පිඹුරේ බෙදා වෙන් කළ ලොට් 14 හා 15 දරන ඉඩම් කොටස් දෙක හා එහි තුළ පිහිටි සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 29 මෙම දේපල, කඩිතල මුදියාන්සේලාගේ චූලානන්ද උට්ටිය කුමාර, කඩිතල කඩිතල මුදියාන්සේලාගේ චාරක බණ්ඩාර, කඩිතල මුදියාන්සේලාගේ සුසිල් සමරවික්‍රම බණ්ඩාර සහ කඩිතල මුදියන්සේලාගේ තිලක් බණ්ඩාර (හවුල්කරුවෝ) පැරමවුන්ට් 200 සහ අයවළුන් ණයකරුවන් හැටියට,

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*ඉඩමට පිවිසීම.*- මාතලේ නගර මධ්‍යයේ සිට දඹුල්ල පාරේ කි. මී. 13 ක් පමණ ගමන් ගත් විට මාර්ගයේ වම් දෙසින් අදාළ දේපල පිහිටා තිබේ. (බෝක්කු අංක 39/2 ත් කි. මී. 39 අතර පිහිටා තිබේ.)

2009 ක් වූ අප්‍රේල් මස 06 වන දින පෙ.ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(යෝජනා සම්මුතිය සඳහා 2009.01.16 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2009.01.22 වන දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුලතදී නොගෙවුවහොත් ගෙවා ඇති 10% මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යධිකාරි (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

දු.ක. 011-2661821, 011-2661815.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර.
දුරකථන අංක : 081-2211025, 071-4755974, ෆැක්ස් අංකය :081-2211025

03-430

---

### සෙලාන් බැන්ක් පී. එල්. සී. ෆස්ට් සිටි ඔෆිස් ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පදිංචියට සුදුසු නිවසක් නුගේගොඩ ගංගොඩවිල ගමේ පිහිටි ගොරකගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. අහංගම විසින් සාදන ලද 1986.03.15 දිනැති අංක 3629 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 2 බී සහ එහි තුළ පිහිටි වරිපනම් අංක 100/1 දරන නිවාස ගොඩනැගිල්ල ඇතුළු අනෙකුත් සියළු දේ ප්‍රමාණය පර්චස් 19.75 ක් සහ එන්. පී. පී. විජේරත්න විසින් සාදන ලද 1969.08.18 වන දින අංක 386 දරන පිඹුරේ සඳහන් ගොරකගහවත්ත ලොට් 3 සහ 1 දරන පාර සඳහා වෙන් කිරීම උඩින්, යටින් හා දිගේ මාර්ග අයිතිය ද සමග.

මෙම දේපල, කොළඹ 05 හයිලෙවල් පාරේ අංක 319 හි සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන නිමල්කා ඉන්ටනැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ නුගේගොඩ පදිංචි හෙට්ටිගේ රංජිත් නිමල්සිරි යන අය බන්ධනදායින් ලෙසට සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉඩමට පිවිසීම.-නුගේගොඩ හන්දියේ සිට මහරගම දෙසට හයිලෙවල් මාර්ගයේ මීටර් 700 ක් ජම්බුගස්මුල්ල මාවත දක්වා ගමන් කර එම මාවතට පිවිස මීටර් 500 ක් පමණ ගිය විට වම් දෙසින් පිහිටි මාර්ග ප්‍රවේශයට ඇතුළු වී ඉදිරියට මීටර් 20 ක් පමණ ගිය විට මෙම පාරේ වම් පසින් අදාළ දේපල පිහිටා තිබේ

2000 ක් වූ අප්‍රේල් මස 08 වන දින පෙ.ව. 11.00ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2003.11.21 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2003.10.16 වන දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් යන පුවත්පත් බලන්න.

